
# මගේ ලෝකය

ඇසෙන දැනෙන දේ..
හිතට වැදෙන දේ..



## මෙල්බර්න් වලදී ලියැවුණු ග්‍රාම්‍ය කවි



අනේ ජගත්
වරෙං අනේ ලංකාවට..
මූදු හතක් පනු කරලා
ආයෙත් යමු ලංකාවට...
අරුණෑල්ලේ සිනා පොදින්
සුසුමක් ආයෙත් අරගෙන..
කරුළු හඬට කන්දීගෙන...
නැවතත් ඇහැරෙමු අලුතින්..

අප්පුහාමි මාමගෙ කඩයට ඇවිදින්
පාන් රාත්තල අරගෙන
කුරුළු හඬට කන්දීගෙන
බොරළු ඇනෙන පාර දිගේ ඇවිදගන් යමු...
සුමනේ මල්ලිගෙ අලුත්ම
'වීල්' එකේ ගමනක් යමු..

හවස් ජාමයට හමු වී
යාලු මිතුරු සිනා හඬයි...
මයියොක්කා හොඳ පදමට
සම්බෝලෙත් ඒ ගානට
ගල් බාගෙත් හොඳටම ඇති...
බෝක්කුවක් අයිනෙ ඉඳන්
රෑහැයි සද්දෙ කවියක් කර ගනිමුද අපි..?

සේකරගේ කවි පදයක්
මානවසිංහගෙ සුසුමක් විදිමුද අපි..?
'මොනවද අම්මේ අකුරු ජාතියක්
මල් පෙති වල කව්දෝ ලියලා
කවිරුද අම්මේ එහෙම ලියන්නේ
පාට පාට පෙති හැඩ කරලා'

සැප සේ දුක් විඳිමුද අපි..?
දුක සේ සැප විඳිමුද අපි..?
අනේ ජගත්
වරෙං අනේ ලංකාවට...

රෝහණ ධර්මකීර්ති
28.09.07
මෙල්බර්න්

ජගත් ජේ එදිරිසිංහ

අද දවසේ ලංකාවේ වඩාත්ම කතා බහට ලක්ව ඇති පුද්ගලයා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ය. ඔහුගේ දේශපාලන දැක්ම කුමක් වුව ද නොපසුබට උත්සාහයකින් හා මහත් කැපවීමකින් ලංකාවේ ඉහළම තනතුර දක්වා ඔහු ආ ගමන විස්මිත ය.

මේ අපූරු දේශපාලඥයා මට දෙවතාවක් හමු වී ඇත. මේ අවස්ථා දෙකම කරුණු කීපයක් නිසා වැදගත් ය.

මහින්ද පළමු වතාවට මට හමුවන්නේ අසූව දශකයේ මුල හරියේ නැත්නම් හැත්තෑව දශකයේ අග හරියේ දින ය. එදා මේ තරුණ දේශපාලනඥයා අපේ නුගේගොඩ නිවසට ගොඩ වුණේ අපේ මාමා කෙනෙකු වන ප්‍රවීණ ලේඛක ලයනල් සරත් (ලයනල් සරත් එදිරිසිංහ) මහතා සමගින් ය.

''විකී.. මේ මහින්ද මහත්තයගෙ අදහසක් තියෙනවා පත්තරයක් ගහන්න.. විකීටත් බැරිද අපට උදව් කරන්න..?'' ලයනල් සරත් මාමා තාත්තාගෙන් ඇසූ හැටි මතකය.

ඔහු මේ යෝජනාවත් රැගෙන තාත්තා හමුවන්නට පැමිණියේ අතීත මතකය නිසා බව මම දනිමි.

1965 ත් 1970 ත් අතර කාලයේ ඩඩ්ලි සේනානායක මහතාගේ ආණ්ඩුව කාලයේ ලයනල් සරත් මාමා ''බජිරි හටන'' නමින් පත්තරයක් කළේ ය. පත්තරයෙන් කළේ ඩඩ්ලි ගේ ආණ්ඩුව නිර්දය ලෙස උපහාසයට ලක් කිරීමයි. ෆෙඩරල් පක්ෂය ද ඇතුළු පක්ෂ හතක් සමග එක් වී පිහිටුවා තිබූ ඩඩ්ලි ගේ ආණ්ඩුව හැඳින්වයේ හත් හවුල යන නමිනි. හත් හවුලෙන් ජනතාවට බජිරි කන්නට සැළැස්වූ කතාවක් මට යාන්තමින් මතකය. බජිරි යනු සත්වාහාර සඳහා ගන්නා ධාන්‍ය විශේෂයකි.

බජිරි හටන පත්තරයේ මුල් පිටුවේ වම් පැත්තේ උඩින්ම හතර පද කවියක් විය. එයින් පද දෙකක් යාන්තම් මතක ය.

''බජිරි හටන අපි දිගටම ගෙනයනවා
බජිරි පාටියේ ලොක්කා රට කනවා''

ඉතා උපහාසාත්මකව ආණ්ඩුව විවේචනය කළ බජිරි හටන ශ්‍රී ලංකාවේ පත්තර ඉතිහාසයේ මුල්ම විකල්ප පත්තරය විය හැකි ය.

ලයනල් සරත් මාමා සමසමාජ පක්ෂයේ ක්‍රියාකාරකයකුව සිටියේ ය. අපේ තාත්තා කොමියුනිස්ට් පක්ෂයේ ය.

බජිරි හටනට මුදල් යෙදූ අය අතරින් තාත්තා ද පෙරමුණේ සිටියේ ය. තාත්තා මේ කාලයේ අතමිට යහමින් තිබූ ව්‍යාපාරිකයෙකුව සිටි අතර පත්තරය පිටු පසින් සිට කිසිදු ප්‍රතිලාභයක් නොලබා ම ඒ වෙනුවෙන් යම් මුදලක් යොදවන්නට තාත්තා කටයුතු කළේ ය. තාත්තාට අවශ්‍ය වූයේ නම දමා ගැනීම නොව තමන් ඇදහූ දේශපාලන මතවාදය වෙනුවෙන් යමක් කිරීම ය.

මහින්ද රාජපක්ෂ මහතා සමගින් ලයනල් සරත් මාමා අපේ නිවසට ගොඩ වූ කාලය වන විට ජීවිතයේ බොහෝ හැලහැප්පීම් සහ අත්දැකීම් විසින් හෙම්බත් කරවනු ලැබ සිටි තාත්තා තමා තරුණ කාලයේ දැරූ දේශපාලන මතවාදයන්ගෙන් බොහෝ දුරට ඈත්වී සිටියේ ය. ශ්‍රී ලංකාවේ දේශපාලනය පිළිබඳව තාත්තා බොහෝ සේ කලකිරී සිටියේ ය. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ කළමණාකරුවකු ලෙස මේ කාලයේ ඔහු සේවය කළ අතර අපට මුදල් අගහිඟතා ද බොහෝ විය.

අලුත් පත්තරයක් කරමුදැයි ලයනල් සරත් මාමා ගෙනා යෝජනාවට තාත්තා සතුටුදායක පිලිතුරක් නොදුන්නේ ය.

මහින්ද රාජපක්ෂ මහතා දෙවන වරට මට හමුවුණේ අසූව දශකයේ අවසන භීෂණ සමයේ දී අත් අඩංගුවට පත්ව සිටි ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික ශාන්ත බණ්ඩාර මහතා යූ එන් පී ආණ්ඩුව විසින් කොන්දේසි විරහිතව නිදහස් කරනු ලැබූ දා ය.

ශාන්ත බණ්ඩාර අත්අඩංගුවට පත් වූ දෙවන අවස්ථාව එය විය. අත් අඩංගුවට පත් වූ පළමු අවස්ථාවේ දී රඳවා සිටි වධකාගාරයෙන් එක්තරා රාත්‍රියක කුමක් හෝ ක්‍රමයකින් පළා ගොස් සැඟවී සිටි ඔහු දෙවන වරට අත් අඩංගුවට පත්ව තරුණයන් මරා දැමීම පිළිබඳව කුප්‍රකට දකුණු පළාතේ පොලීසියක රඳවා තබා සිටියේ ය. ඒ වන විට ඔහු ශාන්ත බණ්ඩාර බව හඳුනාගෙන නොතිබුණි.

''දවසක් රෑ සෙල් එකේ හිටිය එක එක කොල්ලා ගානේ එළියට ගෙනිහින් මරන්න පටන් ගත්තා. අපි එක එක්කෙනා අපේ වාරෙ එනකල් බලාගෙන හිටියා. වෙන අපට කරන්න දෙයක් තිබුණෙ නෑ. මම හිතෙන් ගීතාවලියේ එන ගීතිකාවක් කියමින් හිටියා. අන්තිමේ ඉතිරි වුණේ අපි දෙන්නෙක් විතරයි. වධකයා අන්තිම වතාවට එනකොට ඌට හොඳටම මහන්සියි. අපි දිහා බලලා ඇඟිල්ල දික් කරලා කිව්වා තොපි දෙන්නා හෙට කියලා.'' ශාන්ත බණ්ඩාර පසුව කීවේ ය.

පසුදා වන විට තම අත් අඩංගුවේ මේ පසු වන්නේ ජනතා විමුක්ති පෙරමුණේ නායකයකු බව පොලිසිය දැන ගත්තේ ය. නායකයා ශාන්ත බණ්ඩාර බව ද ඔවුහු හඳුනා ගත්හ. එදිනම ඔහු කොළඹට ගෙන්වා ගනු ලැබූවෙන් ජීවිතය බේරුණි.

ඉතා මිත්‍රශීලී පුද්ගලයකු වූ ශාන්ත එවකට ජනාධිපති ජේ ආර් ගේ පුතා වූ රවි ගේ සිත දිනාගන්නට සමත් වූයේ ය. ශාන්ත හරහා ජවිපෙ සමග යම් සහයෝගිතාවකට එළැඹිය හැකි යයි රජය සිතන්නට ඇත. ඔවුහු කොන්දේසි විරහිතව ශාන්ත බණ්ඩාර නිදහස් කළ හ.

ශාන්ත බණ්ඩාර නිදහස් කළ දා ඔහු රජයෙන් බාරගන්නට මහින්ද රාජපක්ෂ නම් වන තරුණ දේශපානඥයා ද ස්වේච්ඡාවෙන් පැමිණ සිටියේ ය.

කැරැල්ලේ තරුණ ජීවිත බොහෝ ගණනක් බේරා දුන් මානව අයිතීන් වෙනුවෙන් දිවි පරදුවට තබා ක්‍රියා කළ මහින්ද රාජපක්ෂ අද රටේ ජනාධිපති ය. අද ජවිපෙ මහින්ද සමග විරසකය. මහින්දගේ ආණ්ඩුව යටතේත් තරුණයෝ අතුරුදහන් වෙති. මේවා දෙස බලා සිට හැඬිය යුතු ද නැත්නම් සිනාසිය යුතු ද කියා තෝරා බේරා ගත නොහැකිව අපි වික්ෂිප්තව බලා සිටිමු.

(පසු සටහන- තුන් වන වරට අත් අඩංගුවට පත්වන ශාන්ත බණ්ඩාර රජයේ හමුදා විසින් දරුණු වධ බන්ධනයට ලක් කර මරා දමනු ලැබූ බව කියැවෙයි.)

යසෝදා !
පසක් කලා මම තවත් සත්‍යයක්
සාගතයෙන් පෙළෙන තැනක
වගා නොවන බව ධර්මය
සාගින්නෙන් පෙළෙන අයට
පසක් කර ගත නොහැක ධර්මය
සුන්දරත්වය, නිවන .. සත්‍යය..

**මහගම සේකර**
-ප්‍රබුද්ධ-

### අද ඔක්තෝබර් 14

වේලාව මධ්‍යම රාත්‍රිය පසුවී විනාඩි 30 කි

මේ සටහන ලිවිය යුතුම ය.

සරස වසන්තය ප්‍රසංගය නැරඹුවේ සවස ය. සිත සසළ වන සිදුවීම් දෙකකට ඒ ප්‍රසංගයේ දී මුහුණ දුන්නෙමි. ඒ ගැන නොලියා ඉන්නට නොහැකි ය.

තමන් ඔස්ට්‍රේලියානු සරසවියක සිංහල නැටුම් උගන්නවන බව උදුම්බරා සොයුරිය මට කීප වතාවක්ම කියා තිබුණි. නැටුම් කියන ජාතියත් එපා වන තරමට ඔස්ට්‍රේලියවේ අපේ ප්‍රජාවේ නැටුම අවුලක් වී තිබෙන යුගයක උදුම්බරාගේ කතාව මට සාමාන්‍ය ප්‍රවෘත්තියක් පමණක් ම විය. එහෙත් එය හුදු ප්‍රවෘත්තියක් නොවන බව අද සවස උදුම්බරා රැස්ව සිටි සිය ගණනක් වූ ප්‍රේක්ෂකයන් හමුවේ පෙන්වා දුන්නා ය. උදුම්බරා විසින් පුහුණු කරණ ලදුව ඒ වේදිකාවේ සිංහල නැටුමට පණ දුන් සුදු ජාතික තරුණියන් තුන් දෙනාත් තරුණයන් පස් දෙනාත් නැටුමක් නැටිය යුත්තේ කෙසේදැයි අපට පෙන්වා දුන් හ. පාඩමක් ඉගෙන ගන්නට කැමැත්තෝ ඉගෙන ගනිත්වා.

තමන් කිසිදා දැක නැති නර්තන විලාසයන් සියුම්ව ග්‍රහණය කරගනිමින් ඔවුහු ඉදිරිපත් කළ නර්තනය අපේ ඇස් කඳුලින් තෙමන්නට සමත් විය. ඒ කඳුල මේ ලියන මොහොතේදීත් ඇසේ නැගෙයි. ඒ නුඹ වෙනුවෙන් උපන් සතුටු කඳුලකි උදුම්බරා නංගී.

අනෙක් විස්මය කළේ කළිඳු වීරසිංහ සොයුරා යි. රෝහණ වීරසිංහ නම් වන අසහාය සංගීත ශිල්පියාට සම්මානයක් පුදන්නට ශ්‍රීනාත් මද්දුමගේ සොයුරාත් අපත් අනපේක්ෂිත මොහොතක වේදිකාවට කැඳවීමෙන් ඔහු දැක්වූ කෘතවේදීත්වය වසර ගණනාවක් තිස්සේ ඔස්ට්‍රේලියාවේ මාධ්‍ය ක්ෂෙත්‍රයේ දුක් විඳිමින් සිටින අපටත් සන්නස පුවත්පතේත් තිසර ගුවන් විදුලියේත් අප සමඟ සතුටින් ඒ දුක ම අනුභව කරන දසුන් ගජමන් අසෝක සුබසිංහ ඇතුළු සගයන් සැමටත් පුද දුන් සම්මානයක් ම වන්නේ ය.

මේ සමාජය තවමත් යහපත් තැනක් බව ඉඳ හිට හෝ පෙන්වා දෙන නුඹ වැනි මිනිසුන්ට ආදරය නොකර ඉන්නේ කෙසේ ද කළිඳු මල්ලි?